**බෙන්තොට ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 29 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ප්‍රධාන කාර්යාලයේ සිදුකල රු.4,037,861 ක ඉදිකිරීම් සහ වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂය වෙනුවෙන් වූ මුද්දර ගාස්තු ලැබීම් රු.3,110,870 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකර ගතයුතු රු.34,124 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**---------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.19,917,622 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර වූ අසමානතා වල එකතුව රු.531,713 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-----------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**
--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පැවැත එන රු.1,807,900 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂ 08 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2009 වර්ෂයේ සිට අයවිය යුතුව තිබූ රු.104,000 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ හා 2012 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති උසාවි දඩ රු.53,833 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 1993 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලයට අදාළ වූ සභාවේ පෙර ගෙවුම් රු.169,278 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අයත් රු.6,349,023 ක් වූ කර්මාන්ත ණයහිමියෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 1991 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් වියදම් ණයහිමියෝ රු.859,446 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

----------------------------------------------------------

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.54,320,720 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| | **රු.** | |
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| (i) රීති 33 | - | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | රීති 145 | - | ආපසු ගෙවිය යුතු තැන්පත් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයන් සකස් කර, ලෙජරයේ දැක්වෙන ශේෂය සමඟ ගැලපීම් කර නොතිබුණි. |
| (iii) | රීති 193 | - | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | රීති 218 | - | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 110 | - | හානි පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 371(2)(අ) | 159,278 | 1993 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින සාමාන්‍ය අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | 386,923 | වසර 02 ට වඩා කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,949,889 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,686,524 ක් විය.

**(ආ) මූල්‍ය පාලනය**

සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් මාරුකිරීම් ගිණුමේ ශේෂය එකිනෙකට තුලනය වියයුතු වුවද, එසේ නොවීම නිසා මූල්‍ය ප්‍රකාශනවල රු.271,201 ක හර ශේෂයක් දැක්වුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 13,667,900 | 23,950,621 | 17,854,889 | 10,125,943 | 12,840,400 | 15,065,189 | 15,003,992 | 3,933,893 |
| (ii) | කුලී | 532,000 | 658,684 | 557,762 | 102,883 | 482,000 | - | 520,071 | 51,244 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 830,000 | 802,100 | 865,390 | 43,225 | 705,000 | - | 802,658 | 43,225 |
| | | 15,029,900 | 25,411,405 | 19,278,041 | 10,272,051 | 14,027,400 | 15,065,189 | 16,326,721 | 4,028,362 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ සමස්ථ ඇස්තමේන්තුගත ආදායම රු.15,029,900 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම හා වර්ෂයේ හිඟ ආදායම සමඟ රැස්කළයුතු ආදායම රු.29,439,767 ක් විය. වර්ෂය තුළ රැස්කළ ආදායම රු.19,278,041 ක් වීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.10,272,051 විය.

### 2.2.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම හා වර්ෂ ආරම්භයේ හිඟ ශේෂය සමඟ රු.27,884,514 ක රැස්කළ යුතු ආදායමෙන්, වර්ෂය තුළ රැස්කළ ආදායම රු.17,854,889 ක් බැවින් වර්ෂය අවසානයට වූ හිඟ ශේෂය රු.10,125,943 ක් විය.

### 2.2.4 කුලී

සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු ආදායම රු.709,928 කින් රැස්කිරීම් රු.557,762 ක් වූ අතර, වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.102,883 ක් විය.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයට රැස්කළයුතු ආදායම රු.845,325 කින් රැස්කළ ආදායම රු.865,390 ක් වීමෙන් වර්ෂය අවසානයට වූ හිඟ ශේෂය රු.43,225 ක් විය.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.36,496,997 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.2,052,931 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) ඉටු නොකළ කර්තව්‍යයන්**

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේ සංවර්ධන සැලැස්ම යටතේ ඇටවලවත්ත රබර්ගහමුල්ල මාර්ගයේ බෝක්කුව අසල පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයට රු.490,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද, 2018 ජුනි වනවිටත් ඉදිකිරීම් වැඩ ආරම්භ කර නොතිබුණි.

(ii) 2017 වර්ෂයේ ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී.1,000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ආදාහනාගාරයේ ප්‍රවේශ මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.6,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද, 2018 අගෝස්තු වනවිටත් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

------------------------------------------

2016 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ජංගම පුස්තකාල සේවාවන් ඇරඹීමට පුස්තකාල පොත් මිලදී ගැනීම හා උපකරණ මිලදී ගැනීමට, එකතුව රු.486,087 ක් වැයකර තිබුණි. එහෙත් ජංගම පුස්තකාල සේවයේ අවශ්‍යතාවය ප්‍රදේශ රැසකට තිබිය දී ඌරගහ ප්‍රදේශයට පමණක් සතියකට එක් දිනක් ජංගම පුස්තකාල සේවය පවත්වා තිබුණි.

**(ඈ) කසළ කළමනාකරණය**

-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කසළ බැහැර කිරීම සඳහා නගරය ආශ්‍රිතව අක්කර 4 යි රූඩ් 2 යි පර්චස් 10 ක් වූ ජම්බුගස්වත්ත ඔලිවල ඉඩම යොදාගෙන තිබුණි. ඉඩමෙන් ¼ ක පමණ වපසරියක

කසළ වෙන් කිරීමකින් තොරව බැහැර කර තිබුණු අතර, කසළ බැහැර කිරීමෙන් පසුව පස් දමා වසා නොදැමීම නිසා අධික දුර්ගන්ධයක් වහනය විය. 2017 වර්ෂය තුළ කසළ වසා දැමීම වෙනුවෙන් රු.202,500 ක් වැයකර තිබුණි. කසළ බැහැර කරන ඉඩම සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(ii) කසළ වර්ගීකරණය සඳහා මඩුවක් ඉදිකිරීමට සභා අරමුදලින් රු.450,000 ක් වෙන්කර තිබුණ ද, ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකින් යුත් මඩුවක් ඉදිකිරීමට අවස්ථාව තිබිය දී රු.159,709 ක් වැයකර, කුඩා මඩුවක් ඉදිකර තිබුණි. මෙම මඩුව අදාළ කාර්යය සඳහා ප්‍රමාණවත් නොවීය.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සේවක සංඛ්‍යා සැලැස්මට අනුව අතිරික්ත සේවක සංඛ්‍යාව 09 ක් වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව 11 ක් විය. අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට මෙන්ම, පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ii) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් 05 දෙනෙකු වෙනුවෙන් සභා අරමුදලින් වැටුප් හා දීමනා වශයෙන් රු.1,397,099 ක් ගෙවා තිබුණි.

(iii) සභාවේ සේවය කරන කණිෂ්ඨ අංශයේ සේවකයින් 06 දෙනෙකු බඳවාගත් තනතුරට ඉහළ තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා පත්කර තිබුණි.

**(ආ) සේවක ණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා මිය ගිය නිලධාරීන් 27 දෙනෙකුගෙන් අයවිය යුතු රු.102,372 ක් අය කරගෙන නොතිබුණි.

(ii) සභාවේ සේවකයින් විසින් 2007 වර්ෂයේ සිට ලබාගෙන තිබුණු දේපල ණය වෙනුවෙන් ප්‍රතිපූර්ණය කරගතයුතු පොලී රු.130,326 ක් පළාත් පාලන කොමසාරිස් වෙතින් අයකර ගෙන නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පැරණි සභා ගොඩනැගිලි සංකීර්ණයට අයත් දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල 2007 වර්ෂයේ සිට වසා තිබුණි. මෙම ගොඩනැගිල්ල අළුත්වැඩියාවෙන් පසුව ප්‍රයෝජනයට ගතහැකි මට්ටමේ තිබුණු අතර, ගොඩනැගිල්ල තුළ මේස 09 ක්, පුටු 12 ක් හා ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා යොදාගත් රාක්ක 02 ක් නිෂ්ක්‍රීයව තිබුණි.

(ආ) සභාවට අයත් රු.7,188,800 ක් වටිනා වාහන 06 ක් කිසිදු භාවිතයකින් තොරව සභාවේ පුස්තකාලය පිටුපස ගාල්කර තිබුණි.

**3.4 හඳුනාගත් පාඩු**

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ආදාහනාගාරය 2017 මාර්තු මාසයේදී රු.1,274,250 ක් වැයකර, අළුත්වැඩියා කර මෘත දේහ 308 ක් ආදාහනය කිරීමෙන් පසුව 2017 ජුනි 05 දින ආදාහනාගාර ක්‍රියාකරු නොමැතිව වෙනත් සේවකයෙකු ආදාහනාගාරය ක්‍රියාත්මක කරවීම හේතුවෙන් පුපුරා ගොස් තිබුණි. පිපිරීමෙන් පසු ආදාහනාගාරය අළුත්වැඩියාව වෙනුවෙන් රු.299,000 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විගණනයට වාර්තා කර නොතිබුණු අතර, පිපිරීමෙන් සිදු වූ හානි පාඩු තීරණය කිරීම සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) සභාව සතු කැබ් රථය 2017 වර්ෂයේ දී රු.534,064 ක් වැයකර සම්පූර්ණ එන්ජිම අළුත්වැඩියාවක් කර තිබුණු අතර, 2018 මාර්තු 24 දින අධිවේගී මාර්ගයේ ගමන් කරමින් තිබිය දී එන්ජිම නතර වී නැවත පණ ගැන්වීමට නොහැකි වී තිබුණි. එම අවස්ථාව වනවිට අළුත්වැඩියාව කරන ලද ආයතනය ලබා දී තිබූ වගකීම් කාලය ඉකුත්ව නොතිබුණ ද, එම ආයතනය වගකීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ සම්බන්ධයෙන් සභාව ඉදිරි කටයුතු කර නොතිබුණ අතර, කැබ් රථය 2018 අගෝස්තු වනවිටත් වාහන අංගනයේ නතර කර තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) එක් වැය විෂයයක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබූ අතර, තවත් වියදම් විෂයයන් 04 ක එකතුව රු.18,154,746 ක් වූ ඉතිරිවීම් පැවතුණි.

(ආ) වියදම් විෂයයන් 03 ක අයවැයගත සීමාවන් ඉක්මවා රු.436,576 ක වියදම් දරා තිබුණු අතර, එම වටිනාකම් සියයට 04 සිට සියයට 17 දක්වා පරාසයක විය.

(ඇ) ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.18,127,877 ක් වූ අතර, එම වටිනාකම් සියයට 15 ක් හා සියයට 62 ක් විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස් ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2017 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු එකක් පමණක් පවත්වා තිබුණි.

## 5. පද්ධති හා පාලනය

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | ඉකුත් වර්ෂවල සිට ඉදිරියට එන ගිණුම් ශේෂ නිරවුල් නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| | | (ii) | වාහන හා උපකරණවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබීම. |
| (ඇ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම. |
| | | (ii) | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබීම. |
| (ඈ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට, පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබීම. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය හා ව්‍යාපෘති ප්‍රමාද කිරීම් | | ගිවිසුම්ගත පරිදි කොන්ත්‍රාත් නිම කර නොතිබීම. |
| (ඊ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | වර්ගීකරණය කර කසල ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | සෞඛ්‍යයට බාධා නොවන ආකාරයෙන් කසල බැහැර කිරීමට කටයුතු නොකිරීම. |